**පස්සර ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුලි 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පස්සර ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,089,880 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,027,861 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,732,256 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 443 | 345 | 605 |
| (ii) | බදු කුලී | 9,915 | 9,942 | 675 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 463 | 542 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,277 | 945 | 1,061 |

### 2.2.2 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයතුල පවත්නා වරිපනම් බදු දේපල වසර 05 කට වරක් තක්සේරු නොකර 2004 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා ද වරිපනම් බදු අයකරමින් පැවතුනි.

### 2.2.3 බලපත්‍ර ගාස්තු

(අ) සභා බල ප්‍රදේශය තුල වෙළඳ බලපත්‍ර ගාස්තු, කර්මාන්ත හා වෘත්තීන් සම්බන්ධයෙන් බදු අයකළ යුතු ව්‍යාපාර සමීක්ෂණයක් මගින් හඳුනාගෙන නොතිබුණි.

(ආ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ව්‍යාපාර ආදිය සමීක්ෂණයක් මගින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,648,612 |
| (ii) | මුද්දර ගාස්තු | 2,898,000 |

### 2.2.5 කඩ කාමර බදු

පස්සර පොදු වෙළඳපල කඩ කාමර සම්බන්ධයෙන් පළාත් තක්සේරුකරු විසින් 2005 වර්ෂයේ ඉදිරිපත් කළ තක්සේරු වාර්තාව අනුව කුලී අයකිරීම නව ඉදිකිරීම් කළ පසු ක්‍රියාත්මක කිරීම සඳහා

2006 වර්ෂයේ දී සභා තීරණයක් ගෙන තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පැරණි තක්සේරු කුලියට බදු කුලී අයකරමින් පැවතීම නිසා සභාවට අයවිය යුතු විශාල ආදායමක් අහිමිවී තිබුණි.

2.3 **නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

(අ) 1995 වර්ෂයේ දී හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා රැගෙන ගොස් 2009 වර්ෂයේ දී නැවත සභාවට භාරදෙන ලද කැබ් රථය අබලන් තත්ත්වයෙන් සභා අංගනයේ ගාල්කර තිබුණි.

(ආ) ජල බවුසරය 2008 වර්ෂයේ සිට නිෂ්කාර්යව සභා අංගනයේ ගාල්කර තිබුණි.

2.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

සභා රැස්වීම් ශාලාවේ අසුන්ගත්විට සභාපති හා සභිකයින් අතර උපරිම දුර අඩි 18 ක් ද, සභ සභාගර්භයේ දිග අඩි 27 1/2 හා පලල අඩි 19.9 කද වන සභා ගර්භය තුල අභ්‍යන්තර සාකච්ජා පද්ධතියක සවිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.315,379 ක් වැයකර තිබුණි.

2.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1996 සහ 2004 වර්ෂවලදී ආදායම් ලෙස ලැබී අගරු වූ රු.75,712 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර එම වටිනාකම සභා අරමුදලට බැරකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සේවකයින් 33 බඳවාගෙන වැටුප් ගෙවා තිබුණ අතර, පත්වීම් බලධාරියෙකු නොවන සභාපතිවරයා විසින් 16 දෙනෙකු සඳහා පත්වීම් ලිපි නිකුත් කර තිබුණි.

(ඇ) ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය හා විශ්‍රාම ගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.16,039 ක් වූ සේවක ණය ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ජේදයේ 1:6 හා 4 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2005 වර්ෂයට පෙර අවස්ථා දෙකකදී සභාව විසින් විවිධ පාර්ශ්වයන් වෙත ලබාදෙන ලද අත්තිකාරම් රු. 64,496 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි.

2.6 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක නොවන අතර, ප්‍රදේශයේ එකතු වන කසල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් මීදුම්පිටියේ පිහිටි ඉඩමකට අක්‍රමවත් ලෙස බැහැර කරමින් පැවතුනි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය